# මංගලගේ දේශපාලනය

ප්‍රේමදාස ජනාධිපතිතුමා විසින් හිටපු බ්‍රිතානි මහා කොමසාරිස්වරයකු වූ ග්ලැඩ්ස්ටන් මහතා පිටත්කරනු ලැබීමේ පුවත ඇසීමෙන් පසු මට අසනමනට ලැබුණු හොඳම පුවත වූයේ අනුර බණ්ඩාරනායක මහතා ඇමතිධුරයෙන් ඉවත්කරනු ලැබීමේ පුවත ය. ග්ලැඩ්ස්ටන් මහතා බ්‍රිතානියේ හිටපු අගමැතිවරයකුගේ මුණුබුරෙක් විය. බණ්ඩාරනායක මහතා මහමුදලිවරයකුගේ මුණුබුරෙක් පමණක් නොව මෙරට හිටපු අගමැතිවරුන් දෙදෙනකුගේ පුතෙක් ද වෙයි. අනුර බණ්ඩාරනායක මහතාට එ ජා පක්ෂයේ හෝ ශ්‍රී ල නි පක්ෂයේ හෝ නායකත්වය ලැබේවි යැයි සිතිය නො හැකි ය. ඒ මහතාගේ පාසල් මිතුරකු වූ රනිල් වික්‍රමසිංහ මහතාට ද පක්ෂ නායකත්වයේ වැජඹිය හැකි කාලය සීමා වෙයි.ඒ.මහත්වරුන්ගෙන් පසුව මෙරට ප්‍රභූ දේශපාලනයෙහි ද අවසානයක් දකිය හැකිවනු ඇත. කෝල්බෲක් කැමරන් ඊනියා ප්‍රතිසංස්කරණ හෙවත් රට බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට යොමුකිරීමේ යෝජනා ක්‍රියාත්මක වූ දින සිට මෙරට දේශපාලනයෙහි සමස්තයක් ලෙස ගත්කල අපේ නායකයෝ බ්‍රිතානීන් විසින් ඒ සඳහා පත්කරනු ලැබූ ප්‍රභූවරු වූහ. ඒ දේශපාලනයට තව ටික කලකින් අවසන් වනු ඇත.

එහෙත් එයට පළමු නැවත වරක් අනුර බණ්ඩාරනායක මහතා ඇමති ධූරයකට පත්කිරීමේ ප්‍රවණතාවයක් ද වෙයි. ඒ මහතාට තමන් විසින් ම කවටයන්ගේ සර්කස් කණ්ඩායමක් ලෙස හඳුන්වනු ලැබූ කැබිනට් මණ්ඩලයට නැවත යෑමට හැකි ද යන ප්‍රශ්නය එතරම් වැදගත් නොවන්නේ එවැනි දෑ මෙරට කලින් ද සිදු වී ඇති බැවින් ය. එහෙත් ඒ මහතා නැවත ඇමතිවරයකු වන්නේ බාල්දු වී ය. ඒ මහතාට ඇමතිවරයකු නොවී ජීවත්වීමට නොහැකි තත්වයක් උද්ගත වී ඇත් ද? බණ්ඩාරනායක මහතාගේ හා මහත්මියගේ පුතා නොවන්නට ඒ මහතාට ඇමති ධූරයක් නොව ප්‍රාදේශීය සභා මන්ත්‍රී ධූරයක් දැරීමට ඒ මහතා ස්වෝත්සාහයෙන් කර ඇත්තේ කුමක් ද? ඔහු නැවතත් ඇමති ධූරයකට පත්වුව ද ප්‍රභූ දේශපාලනයේ කාලය සීමාවෙමින් ඇත.

අනුර බණ්ඩාරනායක මහතා සමග මංගල සමරවීර හා ශ්‍රීපති සූරියාරච්චි යන මහත්වරු ද ඇමතිධුරවලින් ඉවත්කරනු ලැබූහ. සූරියාරච්චි මහතා දේශපාලනයට ආධුනිකයෙකි. එහෙත් මංගල සමරවීර මහතා මෙරට දේශපාලනයෙහි කැපී පෙනෙන චරිතයක් වෙයි. කලක් කොමියුනිස්ට් පක්ෂයේ සාමාජිකයකු ව සිට පසුව ශ්‍රී ල නි පක්ෂයට බැඳුණු හිටපු ඇමතිවරයකු වූ මහානාම සමරවීර මහතාගේ පුතකු වූ මංගල සමරවීර මහතා එ ජා ප විරෝධියෙකි. විශේෂයෙන් ම රනිල් වික්‍රමසිංහ විරෝධියෙකි. ජේ ආර් ජයවර්ධන මහතා විසින් හැත්තෑහතේ දී නන්නත්තාරකරනු ලැබූ ශ්‍රී ල නි ප බලයට පත්කිරීම සඳහා අනුවේ දශකයේ මුල සිට ම මංගල සමරවීර මහතා කැපවිය. ඒ අතින් ඔහු දෙවැනිවන්නේ මහින්ද රාජපක්ෂ මහතාට පමණක් විය හැකි ය. මහින්ද රාජපක්ෂ මහතාට ද වඩා ඔහු විවිධ සංධාන ඔස්සේ ශ්‍රී ල නි ප බලයට පත්කිරීමට උත්සාහ ගත්තේ ය. 2004 වසරේ දී ජ වි පෙ පොදුජන එක්සත් පෙරමුණ සමග සංධානගත කිරීමේ දී ඔහු විශේෂ කාර්යභාරයක් ඉටුකෙළේ ය. එදා පරිවාස ආණ්ඩුව පිටුපස ප්‍රධාන භූමිකාවක් රග දැක්වූයේ ද ඒ මහතා ය. එයින් කියැවෙන්නේ ඔහු ජ වි පෙ දේශපාලනමය සමග එකඟවන බව නො වෙයි. ෆෙඩරල් වාදියකු වූ සමරවීර මහතාට වර්තමාන ජ  වි පෙ ඒකීය ප්‍රතිපත්තිය සමග ඇත්තේ විරුද්ධත්වයකි. එහෙත් ඒ සියල්ල එ ජා ප පැරදවීම සඳහා අමතකකිරීමට ඔහු සූදානම් ය. ඔහු 1991-2 අවධියේ ද අද තමන් සිටින මතවාදයෙහි ම සිටියෙහි ය. ඔහු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය ලන්ඩනයේ සිට ආපසු ගෙන්වාගැනීමේ දී වික්ටර් අයිවන්, රෙජිනෝල්ඩ් කුරේ රාජිත සේනාරත්න වැනි අය මෙන් ප්‍රධාන කාර්යභාරයක් ඉටු නො කළ ද, ඇගේ පැමිණීමෙන් පසුව ඇයට සිය සම්පූර්ණ සහයෝගය දුන්නේ ය. එකල යුද විරෝධී ප්‍රතිපත්තියක් අනුගමනය කළ, පසුව ජාතික හෙළ උරුමය ලෙස සංවිධානය වූ පිරිසගෙන්, ජනතා මිතුරෝ කණ්ඩායම සමග ඔහු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ නායකත්වයෙන් යුත් පොද පෙරමුණ බලයට පත්කිරීම සඳහා විශාල මහන්සියක් දැරී ය. ඉන්පසු චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියගේ ෆෙඩරල් ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යමින් සුදු නෙළුම් තවලම් ව්‍යාපාර සංවිධානය කෙළේ ය. එසේ වුවත් ඒ මහතා ඒකීය රාජ්‍යය රැකගන්නා බව සඳහන්කරන මහින්ද චින්තන පිළිගත්තේ ය. එසේ පිළිගෙන මහින්ද රාජපක්ෂ මහතා බලයට පත්කිරීමට කටයුතුකෙළේ ය.

එහි දී ටිරාන් අලස් මහතාගේ යැයි කියැවෙන ක්‍රියා කලාපය ද වැදගත් වෙයි. අලස් මහතා මංගල සමරවීර මහතාගේ මිතුරෙක් වෙයි. අලස් මහතා ඔස්සේ ජනාධිපතිවරණයෙහි දී කොටි සංවිධානය සමග සම්මුතියකට පැමිණි බව ද එහි

© Prof. Nalin De Silva

ප්‍රතිඵලයක් ලෙස කොටි සංවිධානය ජනාධිපතිවරණය වර්ජනය කිරීමට කටයුතු කළ බව ද පැවසෙයි. එය මංගල සමරවීර මහතාගේ දැනුවත්කම උඩ සිදුවූ දෙයක් බව ද පැවසෙයි. ඒ කෙසේ වුව ද කොටි සංවිධානය ජනාධිපතිවරණය වර්ජනයකළ බව ද ඒ ක්‍රියාව මහින්ද රාජපක්ෂ මහතාගේ ජයග්‍රහණයට හේතු වූ ප්‍රධාන සාධකයක් බව ද පැහැදිලි ය. එවැනි සම්බන්ධයක් අලස් මහතා ඔස්සේ කොටි සංවිධානය සමග ගොඩනැගුනි නම් එහි දී ප්‍රභාකරන්ට යම් පොරොන්දුවක් දෙනු ලැබිණි ද?

එසේ පොරොන්දුවක් දුන්නත් නැතත් මංගල සමරවීර මහතා කොටි සංවිධානයට එරෙහිව ගෙනගිය හමුදාක්‍රියාමාර්ගවලට විරුද්ධවිණි යැයි කියැවෙයි. අවසානයේ දී විදේශ අමාත්‍යාංශයත් (මංගල සමරවීර මහතාගේ නායකත්වයෙන්) ආරක්ෂක අමාත්‍යාංශයත් අතර කඹ ඇදිල්ලක් වූ බව ද සඳහන් වෙයි. මේ සියල්ල අවසන් වූයේ කැබිනට්ටුව නැවත පත්කිරීමේ දී මංගල සමරවීර මහතාට විදේශ අමාත්‍යාංශය අහිමිවීමෙනි. අද සමරවීර මහතා තනිවෙන ස්වරූපයක් පෙනෙන්නට ඇත. අනුර බණ්ඩාරනායක මහතා නැවතත් බැගෑපත් වී හෝ ඇමති ධුරයක් ලබාගැනීමට කටයුතුකරනු පෙනෙන්නට ඇත. ශ්‍රීපති සූරියාරච්චි මහතා ද ඇතැම් විට නැවතත් ඇමති ධුරයක් ලබාගැනීමට කටයුතුකරනු ඇත. ශ්‍රී ල නි පක්ෂයේ විධායක සභාව ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා කළ නෙරපීම් ඒකමතිකව අනුමත කර ඇත. මංගල සමරවීර මහතාට පිහිටවීමට සමත් අයකු ශ්‍රී ල නි පක්ෂයෙන් සොයාගැනීම කළුනික සෙවීමක් බවට පත්කෙරී ඇත.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට මෙහි දී කළහැකි කිසිවක් ඇතැයි සිතිය නො හැකි ය. මෙරට ජනාධිපති පදවිය හිමි පක්ෂ නායකයකුට විරුද්ධව යෑම පහසු කාර්යයක් නො වෙයි. කුමාරතුංග මහත්මිය අද දේශපාලනයෙන් විශ්‍රාම ගිය තැනැත්තියක ලෙස සැලකීම ඥානාවන්ත ක්‍රියාවක් වෙයි. එසේ නම් මංගල සමරවීර මහතාට විදේශීය විජාතික බලවේගවල හා ඔවුන්ගේ ඉත්තන් වූ රාජ්‍ය නොවන සංවිධානවල ගැත්තන්, ඒ ජා ප හා එයට හිතවාදී ජනමාධ්‍ය හැරෙන්නට සිටිය හැක්කේ ජ වි පෙරමුණ ය. ජ වි පෙ රාජපක්ෂ මහතාට රිදවීම සඳහා සමරවීර මහතාට ආධාරකිරීමේ ප්‍රතිපත්තියක පිහිටන්නේ නම් ඒ වැරදි ය. අද කළ යුත්තේ හැකිනම් සමරවීර මහතා ද රුගෙන ජ වි පෙ ආණ්ඩුවට එකතු වීම ය. අද මෙරට ප්‍රධාන දේශපාලන ක්‍රියාව කොටින්ට එරෙහිව කරන හමුදා ක්‍රියා මාර්ගය ය. සමරවීර මහතා එයට විරුද්ධ ය. ජ වි පෙ ඒ ක්‍රියා මාර්ගය අත්හරිනවාට විරුද්ධ ය. එසේ නම් ජ වි පෙ කළ යුත්තේ රාජපක්ෂ මහතා එය අත්හරින තෙක් පැත්තකට වී ඉන්පසු ඒ මහතාට විරුද්ධව ක්‍රියා මාර්ග ගනිමින් තමන්ට බලයට පැමිණීමට පොටක් පාදාගැනීම නො වෙයි. යම් අයුරකින් රාජපක්ෂ මහතා හමුදා ක්‍රියා මාර්ග අත්හැරියේ යැයි කියමු. එසේ අත්හරින්ට වන්නේ විදේශීය විජාතික බලවේගවල බලපෑම මත ය. එවිට විජාතික බලවේග ජාතික මතවාදයක් දරණ කිසිවකුටවත් බලයට ඒමට ඉඩ නො දෙනු ඇත. හමුදා මෙහෙයුම් අත්හැරීමට සිදුවුවහොත් එසේ වන්නේ ජාතික බලවේග සියල්ල විනාශ වෙමිනි. ජාතික බලවේග පදනම්කරගනිමින් ජ වි පෙරමුණට බලයට පත්වීමට එවිට ඉඩක් නො ලැබෙනු ඇත.

ජාතික බලවේග හා විජාතික බලවේග අතර අද ඇත්තේ උග්‍ර අරගලයකි. මහින්ද රාජපක්ෂ මහතාට විජාතික බලවේගවලට සාර්ථක ව මුහුණ දීමට මෙතෙක් හැකි වී ඇත. ඒ සාර්ථකව කළ හැක්කේ ජනතාවගෙන් වැඩි කොටසක් තම නායකත්වය යටතේ සංවිධානය කරගැනීමෙන් හා ශක්තිමත් දේශපාලන නායකත්වයක් සැපයීමෙනි. කස්ත්‍රෝ මහතාගේ සාර්ථකත්වයේ පදනම එයයි. සදාම් හුසේන් ශක්තිමත් නායකයකු වූ නමුත් ඔහුට ජනතාව තමන් වටා ඒකරාශී කරගැනීමට නො හැකි විය. අප කළයුත්තේ රාජපක්ෂ මහතා විජාතික බලවේගවලට යටත්වන තුරු බලා සිටීම නොව විජාතික බලවේගවලට මුහුණ දීමට ඒ මහතාට ශක්තිය ලබාදීම ය. මංගල සමරවීර මහතා පිටුපස අද විජාතික බලවේග ක්‍රියාත්මක වෙයි. අනුර බණ්ඩාරනායක මහතාට කළ හැකි දෙයක් නොමැති බව විජාතික බලවේග දනියි. එහෙත් මංගල සමරවීර මහතා යමක් කළ හැකි පුද්ගලයෙක් වෙයි. මහින්ද රාජපක්ෂ මහතාට එරෙහිව අද මංගල සමරවීර මහතා සමග ජාතික බලවේගවල කිසිම කොටසක් එකතුවිය යුතු නො වෙයි. හැකිනම් කළ යුත්තේ ඔහු විජාතික බලවේගවලින් ගලවාගෙන නැවත මහින්ද රාජපක්ෂ මහතා වෙතට ගෙනයෑම ය. ආණ්ඩුවේ අද සිටින ෆෙඩරල්වාදීන් ගැන අපට බියක් නැත. තිස්ස විතාරණ ඩිව් ගුණසේකර ආදීන්ට කළහැකි ඉටිගෙඩියක් නැත. ජාතික හා විජාතික බලවේග අතර සටන අද ඇත්තේ පාර්ලිමේන්තුවේ නොව යුද බිමෙහි ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva